කුච්චවේලි ප්‍රාදේශිය සභාව

ත්‍රිකුණාමලය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අගෝස්තු 23 දින ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 26 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

1.2 මතය

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව, කුච්චවේලි ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට ඇතිවන බලපෑම හැර, 2012 දෙසැම්බර් 31 දිනට කුච්චවේලි ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්විම.

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සභාව එහි මෙහෙයුම් කටයුතු සහ ආදායම් ඉපැයීම සඳහා රු.97,550,980 ක් වටිනා ස්ථාවර වත්කම් භාවිතා කර තිබුණි. කෙසේ වුවද මෙම වත්කම් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති වියදම් මගින් සභාවේ තථ්‍ය වියදම පිළිඹිබු නොවේ.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 1979 අංක 42 දරන මුද්දර ගාස්තු පනත අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අයකරගත යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනයන්ට ඇතුලත් කර නොතිබුණි.

(ආ) රු. 1,523 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරිමට කටයුතු නොකොට ශේෂ පත්‍රෙය් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ පළාත් පාලන කොමසාරිස්වරයා වෙනුවෙන් පුල්මුඩෙයි ප්‍රදේශයේ අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූ පුද්ගලයින් සඳහා ගෙවන ලද රු. 2,354,448 ක් වූ මුදලක් එම ආයතනයන්ගෙන් අයකර නොතිබුණි.

(ආ) එකතුව රු.425,371 ක් වූ නොගෙවූ වැටුප් සහ වේතන ශේෂයන් වර්ෂ ගණනාවක් තිස්සේ නිරවුල් කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

--------------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් එම එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම නිසා විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 37,458,666 | හිමිකම් ඔප්පු ස්ථාවර වත්කම් ලේඛණය |
| පිරියත් සහ යන්ත්‍රසූත්‍ර | 1,822,623 | ස්ථාවර වත්කම් ලේඛණය |
| මෝටර් වාහන | 785,993 | සමීක්ෂණ මණ්ඩල වාර්තාව |
| ආදායම් ණයගැතියෝ | 14,331,350 | විස්තරාත්මක උපලේඛන, |
| කලින් ගෙවීම් | 11,545,305 | ශේෂ සනාථ කිරීම් සහ කාල විශ්ලේෂණ |
| ටෙන්ඩර් තැන්පතු | 584,635 | විස්තරාත්මක උපලේඛන |
| නිරවුල් නොකළ වැටුප් අත්තිකාරම් | 299,018 | කාල විශ්ලේෂණ |
| ආදායම් තැන්පතු | 156,650 | |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.12,388,432 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.7,865,369 ක් විය.

2.2 අයවැය පාලනය

අයවැය ලේඛනය සහ තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරික්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණු බැව් පෙන්නුම් කෙරේ.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය මුදල් සහ ගබඩා සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරින්ගෙන් අංක 554/5 සහ 1989 අප්‍රේල් 17 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1988 ප්‍රාදේශිය සභා ( මූල්‍ය සහ පරිපාලන ) රීති මාලාවේ ix පරිච්ඡේදයේ 180 රීතිය ප්‍රකාරව ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේදි නිකුත් කරන ලදුව ගෙවිම සඳහා ඉදිරිපත් නොකරන ලද වටිනාකම රු.512,368 ක් වු චෙක්පත් 130 ක් සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් මුදල් රෙගුලාසි 237 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) නැගෙනහිර පළාත් මුදල් රෙගුලාසි 432 ප්‍රකාරව වාහන ලොග් පොත් සහ දෛනික ධාවන වාර්තා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

3. පද්ධති සහ පාලන

------------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) වත්කම් පාලනය
(ඈ) තොග පාලනය
(ඉ) අත්තිකාරම් නිරවුල් කිරිම